# බදුල්ල මහා නගර සභාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 30 දින දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණ අතර, 2011 වර්ෂයේ සභාවේ කාර්ය සාධනය පිළිබඳ වාර්තාව 2012 සැප්තැම්බර් 03 දින නගරාධිපතිවරයා වෙත යවන ලදී.

### 1.2 ගනුදෙනු, මෙහෙයුම් හා කාර්ය සාධනය පිළිබඳව අදහස් දැක්වීම.

#### 1.2.1 පිළිතුරු නොලත් විගණන විමසුම්

2012 මාර්තු 31 දින වන විට විගණන විමසුම් 10 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය පාලනය

(අ) තැන්පත් කළ නමුත්, බැංකුවට බැර නොවූ රු.27,190 ක් වටිනා චෙක්පතක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 188 (2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 1999 සිට 2010 දක්වා කාලය තුළ අගරු වී තිබූ රු.1,154,334 ක් වටිනා චෙක්පත් 89 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 189 විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 371 විධිවිධාන ප්‍රකාරව 1998 සිට 2011 දක්වා කාලය තුළ අවස්ථා 69 ක දී විවිධ පාර්ශවයන් වෙත ගෙවන ලද රු.3,952,759 ක් වූ අත්තිකාරම් 2011 දෙසැම්බර් 31 දින වන විටද පියවාගෙන නොතිබුණි.

(ඈ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වගන්තියේ නියමය අනුව 2009 මාර්තු සිට 2011 මාර්තු දක්වා කාලය තුල රඳවාගත් බදු රු.154,058 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 46,264 | 15,429 | 30,835 |
| (ii) | බදු කුලී | 9,774 | 5,942 | 3,832 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,783 | 1,856 | 847 |
| (iv) | වෙනත් ආදායම් | 5,138 | 3,779 | 1,359 |

### 2.2.2 කඩ කාමර බදු

(අ) අවස්ථා 58 කදී සභා කඩ කාමර බදුදීමේ දී ගිවිසුම්ගත බදු මුදලට වඩා අඩු මාසික බදු මුදලක් අයකර තිබීම නිසා 2011 දෙසැම්බර් 31 දින වන විට සභාවට ලබාගත හැකිව තිබුන රු.3,502,200 ක ආදායමක් අහිමිව තිබුණි.

(ආ) සභාව සතු කඩ කාමර 15 ක් සඳහා මාස 31 සිට මාස 258 දක්වා කාල පරාසයක් වෙනුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කුලී රු.3,721,369 ක් අයකරගෙන නොතිබුණි.

(ඇ) 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන ඌව පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 1 සහ 2 වගන්ති ප්‍රකාරව සභාවේ කඩකාමර මාසික කුලිය ප්‍රධාන තක්සේරුකරු මගින් හෝ පළාත් පාලන සේවයේ තක්සේරුකරුවකු මගින් අවම වශයෙන් වසර 05 කට වරක්වත් තක්සේරු කරවාගත යුත වුවද කඩ කාමර 503 ක වෙනුවෙන් එවැනි තක්සේරුවක් කර නොතිබුණි.

(ඈ) ඉහත චක්‍රලේඛයේ 7 වගන්තිය ප්‍රකාරව කඩ කාමර අතුරු බදුදීම තහනම් වුවද, සභාවේ කඩ කාමර 61 ක් බදුගත් බදුකරුවන් විසින් ඒවා වෙනත් අය වෙත අතුරු බදු දී තිබූ අතර, සභාව ඔවුන්ගේ ඉල්ලීම මත, පැවරුම් ගාස්තුවක් අයකරගෙන නව බදුකරුවන් වෙත කඩ කාමරවල බදු අයිතිය පවරා තිබුණි.

(ඉ) නව වෙළඳ සංකීර්ණයේ දෙවන මහල කුලියට දීමේ දී අත්සන් කළ ගිවිසුම ප්‍රකාරව වර්ෂ 5 කට වරක් කුලිය 10% කින් වැඩිකර අය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව රු.27,300 ක මුදලක් අහිමිවී තිබුණි.

2.2.3 විනෝද බදු

සභා බල ප්‍රදේශය තුල පිහිටි සිනමාහල් දෙකක මහා නගර සභාවේ නිල මුද්‍රාව රහිත ප්‍රවේශ පත්‍ර පොත් අලෙවිකරමින් පැවති අතර, 2011 ජනවාරි සිට මැයි දක්වා කාලය සඳහා රු.90,969 ක විනෝද බදු මුදල් හිඟව පැවතිනි.

2.2.4 ගෝඝාතක බලපත්‍ර

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනතට අනුව වන සම්පත් හා පාරිසරික අමාත්‍යවරයා විසින් නිකුත් කළ 2000 නොවැම්බර් 22 දිනැති අංක: 1159/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ "අ" උප ලේඛණයේ විධිවිධාන ප්‍රකාරව සභාවේ ගෝඝාතකාගාරය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

## 2.3 ආර්ථික නොවූ ගනුදෙනු

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ මූල්‍ය අනුග්‍රහය යටතේ 2008 වර්ෂයේ සට 2011 දෙසැම්බර් දක්වා රු.49,581,503 ක වියදමක් දරා ඉදිකළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය නාගරික සංවර්ධන අධිකාරිය අනුමත කර තිබූ නගර සංවර්ධන සංයුක්ත සැලැස්මට අනුකූල නොවීම නිසා එම ස්ථානයෙන් ඉවත්කර ක්‍රීඩා පිටිය වැඩිදියුණු කිරීමට තීරණය කිරීම හේතුවෙන් අදාල මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.